සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ක්‍රිස්තියානි ධර්මය II
கிறிஸ்தவம் II
Christianity II

**43 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) යුහුබැද එන පාරාවෝ රජුගේ හමුදාව ඉදිරියේ අසරණ වූ ඉශ්‍රායෙල් ජනයා අවලාද කීවේ කවුරුන් හට ද? (ලකුණු 02යි)

   (ii) දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනයා සමග වැඩ සිටීමේ හා මඟ පෙන්වීමේ සලකුණු **දෙක** සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (iii) කාන්තාර ගමනේ දී ඉශ්‍රායෙල් ජනතාව කෙදිරි ගෑමේ ප්‍රධාන අවස්ථා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) දෙවියන් වහන්සේ පුරාණ ගිවිසුමේ තෝරාගත් ජනතාවට අනාවරණය වීම තුළ ඔබට ලැබෙන අත්දැකීමෙන් සමාජයට කළ හැකි සේවා **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

2. (i) හෙබ්‍රෙව් බසින් දිවැසිවරයා 'නබී' ලෙස හඳුන්වනු ලැබේ. එම වචනයේ අර්ථ **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

   (ii) පැරණි දිවැසිවරුන්ගේ දූත මෙහෙවරෙහි ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (iii) නාතාන් දිවැසිවරයා විසින් දාවිත් රජුට ප්‍රකාශ කළ මෙසියස්තුමා සම්බන්ධ වැදගත් කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ ඔබ ලද දිවැසිවර කාර්යය අද සමාජය තුළ ජීවත් කරවන ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

3. (i) ශ්‍රී ලංකා සභා ඉතිහාසය හැදෑරිය යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

   (ii) ක්‍රි. ව. 1505ට පෙර (පෘතුගීසින් පැමිණීමට පෙර) ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (iii) සිය රාජ්‍යය ආරක්ෂා කර ගැනීමට හත් වන බුවනෙකබාහු රජු විසින් තම රාජ දූතයා පෘතුගාලයේ ලිස්බන් නුවරට යවා ඉදිරිපත් කළ ඉල්ලීම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

   (iv) ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන්ගෙන් සිදු වූ සේවා **හතරක්** සඳහන් කර ඒ අනුව, වර්තමානයේ ධර්මදූත සේවයේ නියැලෙන්නන් ක්‍රියා කළ යුතු ආකාරය කරුණු **හතරකින්** පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

## II කොටස

**4.** (i) ජොෂියා රජතුමා පිළිබඳ වැදගත් කරුණු **පහක්** සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) එක්සත් දේශයක් ගොඩනැඟීමෙහි ලා තරුණ දරුවකු ලෙස ජාතික ආගමික සංහිඳියාව සඳහා ගත හැකි පියවර **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

**5.** (i) ජොහන් සුබාරංචියේ මුඛ්‍ය පරමාර්ථය ලියා එයට අදාළ මූලාශ්‍ර **හතරක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) සුබාරංචි කතුවරුන් 'ක්‍රිස්තුන් වහන්සේ නැමැති සුබාරංචිය' ප්‍රචලිත කිරීමට ගත් උත්සාහය ඇදහිල්ල හීන වූ සමාජයක් තුළ ඔබ ක්‍රියාවට නංවන ආකාරය කරුණු **පහකින්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**6.** (i) මිනා මංගල දේශනාවේ පරමාර්ථ **පහ** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) මිනිස් සිත් තුළ ඇති අධම ගති මෙන් ම නපුරු අන්ධකාරයන් රජයන සමාජයක ඔබ පොළොවේ ලවණ මෙන් ම ලෝකයේ ආලෝකය මෙන් ද ක්‍රියා කරන ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)

**7.** (i) ක්‍රි. ව. 313 දී නිකුත් වූ ආඥාව සමඟ ලැබුණු වරප්‍රසාද **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) වත්මන් කිතුනුවන් ලෙස ජීවිත අභියෝගවලට මුහුණ දීමේ දී දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය සවිමත් කර ගැනීමට ගත හැකි ක්‍රියාවන් **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

**8.** (i) මානව සංවර්ධනය සඳහා කිතුනු සහභාගිත්වය පිළිබඳ ශුද්ධ බයිබලය හා සභා ඉගැන්වීම අනුසාරයෙන් කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) යුද ගිනි ඇවිළෙන නූතන ලොව තුළ ලෝක සාමය උදාකිරීමෙහි ලා කිතුනුවකු ලෙස ඔබ ඉදිරිපත් කරන යෝජනා **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank